# නිවේදනය යි!

**පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් වෙත.**

**1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත උල්ලංඝනය කරමින් ග්ලයිෆොසේට් අඩංගු නිෂ්පාදන ඇසිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම.**

නීති විරෝධී ග්ලයිෆොසේට් සංයෝජන ඇසිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම වැනි වංචනික ක්‍රියා සම්බන්ධයෙන් ඉතා අභියෝගාත්මක සංසිද්ධීන් වාර්තා වී ඇති අතර, දියර පොහොර හෝ වෙනත් කෘෂිකාර්මික යෙදවුමක් විලාසයෙන් සමහර වැවිළි සහ කෘෂිකාර්මික ප්‍රදේශවල ග්ලයිෆොසේට් සංයෝජන බෙදාහරිමින් තිබිය දී හමු වූ අවස්ථා ඇත. අනුරාධපුර ප්‍රදේශයෙන් හමු වී ඇති මේ සමඟ දැක්වෙන MONZAN/G K-40 යන වෙළෙඳනාමය සහිත කුඩා ඇසුරුම් සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික රසායනාගාර පරීක්ෂාවන් මඟින් මෙම ඇසුරුම් තුළ ග්ලයිෆොසේට් අඩංගු බව තහවුරු කර ඇත. කුඨ ජාවාරම්කරුවන් නීතියේ රැහැනින් ගැලවීයාමට අවස්ථාවක් කර ගෙන ඇති මෙවැනි අවස්ථා සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සහ සුපරීක්ෂාකාරීව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

දිවයිනේ සමහර පළිබෝධනාශක අලෙවිසැල් සම්බන්ධ කර ගනිමින් සිදු කරන මෙම නීති විරෝධී අලෙවි ක්‍රියාකාරකම් පිළිබඳව උක්ත පනත යටතේ දිවයින පුරා සිටින නම් කරන ලද බලයලත් නිලධාරීන් සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් වශයෙන් එක් එක් නිලධාරීන් සතු පරිපාලන බල ප්‍රදේශ ආවරණය වන පරිදි දිවයින පුරා අවශ්‍ය විමර්ශණ සිදුකර මෙවැනි නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.




ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2019 දෙසැම්බර් මස 26 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076 (Mobile) 0772363824